ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016/06/24 |

## ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය

වෘත්තීය ගැනුම්කරුවන්, ව්‍යාපාර පිළිබඳව තීරණ ගන්නන් හා ආර්ථික විශ්ලේෂකයන්ට කර්මාන්ත තත්ත්වයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වන කාලීන දත්ත ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2015 මැයි මස සිට නිෂ්පාදන සහ සේවා කටයුතුවලට අදාළව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණය දෙපාර්තමේන්තුව මගින් මාසිකව පවත්වන ලද අතර එය 2016 අප්‍රේල් මාසය වන විට වසරක කාලරාමුවක් සම්පූර්ණ කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මෙම දත්ත මහජනතාවගේ දැනුම්වත් වීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට තීරණය කරන ලදී.

පසුගිය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගයන් ද ඇතුලත්ව ඇති 2016 මැයි මස සමීක්ෂණයෙහි වාර්තාව පහත දක්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි සංඛ්‍යාන අංශය යටතේ මෙම සමීක්ෂණයෙහි ප්‍රතිඵල සඳහා ප්‍රවේශ විය හැකි අතර මෙම තොරතුරු මාසික පදනමින් යාවත්කාලීන වනු ඇත.

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල


වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 මැයි මාසයේ දී 47.9 ක දර්ශක අගයක් වාර්තා කරමින් අනුගාමී දෙවැනි මාසය සඳහාත් කඩයිම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50 ට වඩා අඩු අගයක් වාර්තා කරන ලදී. එනමුත් මෙය 2016 අප්‍රේල් මාසයෙහි වාර්තා කරන ලද 41.6 ක දර්ශක අගය සමග සැසඳීමේ දී දළ වර්ධනයකි. කෙසේ වුවද, වාර්ෂික පදනමින් ගත් කල 2015 මැයි මස සමීක්ෂණයේ ප්‍රතිඵල වලට සාපේක්ෂව මෙය දර්ශක අගයන් 19.4 ක පහත වැටීමකි. මැයි මස අවසන් සති දෙක තුළ දී පැවැති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සමස්ත නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා ඇති වූ බලපෑම මෙම සංකෝචනයට ප්‍රධාන වශයෙන් හේතු වූ බව සමීක්ෂණයට තොරතුරු සපයන්නන් සඳහන් කරන ලදී. ඔවුන්ගෙන් සියයට 29 කගේ කර්මාන්තශාලා පරිශ්‍රයන්ට ගංවතුර තත්ත්වයෙන් ඍජුව බලපෑම් ඇති වී ඇති අතර අනෙකුත් බොහෝ ආයතන සේවකයන්ගේ නොපැමිණීම සහ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් බාධාවීම් ඇති වූ බව සඳහන් කර ඇත. එනමුත් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරි අපේක්ෂාවන්හි යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** මැයි මාසයේ දී 58.1 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. එය මෙම සමීක්ෂණය ආරම්භ කළ තැන් සිට වාර්තා වූ අවම අගය වන 2016 අප්‍රේල් මස වාර්තා වූ 54.1 යන දර්ශක අගය හා සසඳන කළ යථා තත්ත්වයට පත්වීමකි. මෙයින් සනාථ වන්නේ 2016 අප්‍රේල් මාසයට සාපේක්ෂව මැයි මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ බවයි. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි වර්ධනය සඳහා නව ව්‍යාපාර, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් හා අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශක ධනාත්මක දායකත්වයක් සපයන ලදී. ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය 2016 මැයි මාසයේ දී වර්ධනයක් දැක්වුවද, එය සමීක්ෂණය ඇරඹුනු තැන් පටන් වාර්තා වූ අවම අගය විය. ඇතැම් සේවා අංශයන්හි කාර්යබහුල සමය නිමාවීම මෙම උපදර්ශකයෙහි අඩු වර්ධන වේගයට හේතු විය. අය කරන මිල ගණන් උප දර්ශකය මැයි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

| වර්ෂය | මාසය | නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය |
|---|---|---|---|
| 2015 | මැයි | 67.3 | 66.8 |
| | ජූනි | 57.5 | 65.0 |
| | ජූලි | 55.5 | 60.6 |
| | අගෝස්තු | 56.5 | 59.8 |
| | සැප්තැම්බර් | 53.2 | 61.7 |
| | ඔක්තෝබර් | 57.8 | 59.5 |
| | නොවැම්බර් | 54.8 | 59.3 |
| | දෙසැම්බර් | 57.9 | 60.2 |
| 2016 | ජනවාරි | 51.9 | 58.0 |
| | පෙබරවාරි | 55.3 | 59.3 |
| | මාර්තු | 60.7 | 61.6 |
| | අප්‍රේල් | 41.6 | 54.7 |
| | මැයි | 47.9 | 58.1 |


නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
67.3
57.5
55.5
56.5
53.2
57.8
54.8
57.9
51.9
55.3
60.7
41.6
47.9
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්.
ඔක්.
නොවැ.
දෙසැ.
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
2015
2016
නව ඇණවුම් දර්ශකය
නිෂ්පාදන දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
ගැනුම් තොග දර්ශකය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාල දර්ශකය
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
66.8
65.0
60.6
59.8
61.7
59.5
59.3
60.2
58.0
59.3
61.6
54.7
58.1
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්.
ඔක්.
නොවැ.
දෙසැ.
ජන.
පෙබ.
මාර්.
අප්‍රේ.
මැයි
2015
2016
නව ව්‍යාපාර දර්ශකය
ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
නිම කිරීමට නියමිත කාර්යයන් දර්ශකය
අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් සරල සසම්භාවී නියැදි ක්‍රමය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන සමාගම් 150 ක සහ සේවා සමාගම් 140 ක නියැදියක් සමීක්ෂණයට තෝරා ගන්නා ලදී. මෙහිදී එක් එක් අංශය සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 ක ඉලක්කගත නියැදියක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.